# මහායාන බුදු සමයේ ප්‍රචලිත අවලෝකිතේශ්වර බෝධිසත්ව සංකල්පය සහ තාරා දෙවඟන

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අජිත තලවත්ත

ගෞතම බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වසර සියයක් ගතවීමෙන් පසු පවත්වන ලද දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස ථෙරවාදී සහ මහායාන යනුවෙන් ප්‍රධාන නිකාය දෙකක් ආරම්භ වූ බව පැහැදිලි ය. මෙම ප්‍රධාන බෙදීම සසුනේ චිර පැවැත්මට බෙහෙවින් බලපෑ ලද අතර ඒ හා බැඳුණු පිළිවෙත් හා සම්ප්‍රදායන්හී ද බොහෝ වෙනස්කම් දක්නට ලැබුණි. ක්‍රි. පූ. තුන් වන සියවසේ මෙරට කේන්ද්‍රගත වූ බෞද්ධ සම්ප්‍රදාය ක්‍රමිකව විකාශනය වී වට්ටගාමිණී අභය රාජ්‍ය සමයේ ඇති වූ බෙදීම ශාසනික බෙදීමක් දක්වා වර්ධනය වීමට තදින් ම බලවේය. බුදු දහම මුල් කරගත් මෙරට පාලකයා මෙම බෙදීමට පක්ෂ විපක්ෂ වීමත් සමඟ නව සම්ප්‍රදායක් ද ගොඩ නැගුණි. ඇතැම් අවස්ථාවල ථෙරවාදය අභිබවා මහායානය ශීඝ්‍රයෙන් ලාංකීක සමාජය තුළ ව්‍යාප්ත වූ බව වඩාත් පැහැදිලි ය. මහායානය තුළින් ප්‍රචලිත වූ බෝධිසත්ව සංකල්පය ලාංකීක සමාජයට ලබා දුන්නේ සුවිශේෂී තත්ත්වයකි. මෙමගින් විග්‍රහ කිරීමට අපේක්ෂා කරන්නේ අවලෝකිතේශ්වර බෝධිසත්ව

---

"සම්බෝධිනී", ශාස්ත්‍රීය සංග්‍රහය - දෙවන කලාපය, සංස්. ඇහැලේපොල මහින්ද හිමි, හාල්යාලේ පඤ්ඤානන්ද හිමි, 2016.

වන්දනය ආරම්භය හා එය මෙරට තුළ ස්ථාපිත වීමත් හා තාරා දෙවඟන පිළිබඳ සුවිශේෂී අවධානයක් යොමු කිරීමට අපේක්ෂා කෙරේ.

මහායාන බුදුදහම තුළ අවධානයට ලක්වන ප්‍රධාන ලක්ෂණයක් නම් බෝධිසත්ව, වන්දනාවයි. මෙරට ඇති වූ මහායානික බලපෑම නිසා බෝධිසත්ව ඇදහීම් ප්‍රචලිත විය. ලංකාවේ ප්‍රචලිත වූ බෝධිසත්ව සංකල්පයේ ප්‍රභවය කෙසේ සිදුවූවා ද යන්න විමසා බැලිය යුතු වේ. ථෙරවාදී හා මහායාන යන සම්ප්‍රදායන් දෙකේ ම අඩු වැඩි වශයෙන් එන සංකල්පයක් ලෙස බෝධිසත්ව සංකල්පය හඳුනාගත හැකිය."චතුර්විධ මාර්ග ඥානය ද, සර්වඥතා ඥානය ද බෝධි නම් වෙයි. එහි ඇළුණු බැවින් ද බුදුන් කෙරෙහි ඇති ව්‍යාකරණ හෙයින් ද එතැන්හි බුජ්ඣානක සත්වයයි ද, බෝධිසත්ව නම් ලෙස ජාතක අටුවා ගැටපදයේ සඳහන් වේ".[1] එහි බෝධි ශබ්දයෙන් මාර්ග ඥානය සහ සර්වඥතා ඥානය ගැනෙන බවත් සත්ත්ව ශබ්දයෙන් සත්ත, සත්භාව සහ සත්ත්ව යන අර්ථය අන්තර්ගත වේ.[2] බුද්ධඝෝෂ හිමියන් ප්‍රපංචසූදනියේ, බෝධිසත්ව, යන්නෙන් දීපංකර පාද මූලයේ සිට බුද්ධත්වය පතා ගෙන ඒ ඒ ජාතීන්හි උපන් බෝධි සඳහා ඇළුණු තැනැත්තා යන අදහස දක්වන බවට කඹුරුපිටියේ වනරතන හිමියෝ පවසති.[3] සම්මා සම්බුද්ධත්වය සඳහා බෝධිචිත්තය ඇත්තා වූ ද සම්මා සම්බුද්ධත්වයට පත් වන බවට වෙනත් සම්බුදුවරයකුගේ නියත විවරණ ලද්දා වූද පාරමිතා පුරන්නා වූ ද බෝධිසත්ව භූමිවලට පිළිපන්නා වූ ද තැනැත්තා බුද්ධත්වය සඳහා කැප වූවෙක් බවයි. එතුමා බෝධිසත්ව යනුවෙන් හඳුන්වනු ලබන බව Alice Getty ගේ The Gods of Northern Budhism කෘතියෙහි බෝධිසත්ව පිළිබඳ කළ නිර්වචනය මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගේ උපුටා දක්වයි.[4] මෙම නිර්වචනය සඳහා හේතු වී ඇත්තේ ථෙරවාදී ඉගැන්වීම් බව කිව හැකිය., පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බෝධිසත්තස්ස සතො, යනුවෙන් භයභෙරව සූත්‍රයේ දී බුදුන් වහන්සේ ම බුද්ධත්වය ලැබීමට පෙර බුද්ධත්වය

මහායාන බෝධිසත්ත්වවරු සම්භෝගකාය ලෙස සුඛාඅක්‍ෂෝභ්‍යවතියෙහි වෙසෙති. ධ්‍යානි බුදුවරුන්ගේ පුත්‍රයන් වශයෙන් ඔවුහු සැලකෙති. ඒ අනුව වෛරෝචන, රත්නසම්භව, අමිතාභ හා අමෝඝසිද්ධි ධ්‍යානි බුදුවරුන්ට පිළිවෙළින් සමන්තභද්‍ර, වජ්‍රපාණී, රත්නපාණී, පද්මපාරණී, අවලෝකිතේශ්වර හා විශ්වභරති යන බෝධිසත්ත්ව පුත්‍රයෝ වෙති. මොවුන් අතුරින් වඩා වැදගත් වන්නේ අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන් ය.

බෝධිසත්ත්ව සංකල්පය ආරම්භ වූයේ මහායානයේ ආරම්භයත් සමඟ ය. මෙම සංකල්පය ආරම්භ වූයේ කෙදින ද යන්න නිශ්චිත තැතක් ක්‍රි.ව. දෙවන සියවසේ පමණ භාරතයේ හා අවට ප්‍රදේශයන්හි ආරම්භ ව පසුව වෙනත් රටවලට ද ව්‍යාප්ත වී ඇති බව පෙනේ. ගන්ධාරය කේන්ද්‍ර කරගෙන කණිෂ්ක රාජ සමයෙත් පසුව මහායානයේ ආරම්භය සිදු වී ඇති බව ඓතිහාසික වාර්තාවලින් එන තොරතුරු මගින් පැහැදිලි වේ. මහායානික අදහස් ප්‍රචලිත වීමට බලපෑ අනෙක් ඓතිහාසික සාධකය වයඹ දිග ඉන්දියාවේ සිට පැමිණි ආක්‍රමණිකයන්ගේ ආගම බුද්ධාගමේ මූලික ලක්ෂණයන්ගෙන් බැහැරව තිබුණි. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ බව නොසැලකූ මිනිසුන්, වරින්වර පහළ වන රාම, ක්‍රිෂ්ණා වැනි විමුක්තිදායි දෙවියන් ලෙස සලකන ලදහ. ඓතිහාසික ගෞතමයන් වහන්සේ ආදීම බුද්ධ හෙවත් දෙවියන්ගේ අවතාරය ලෙස සලකනු ලදහ. බෝධිසත්ත්ව සංකල්පය ආරම්භ වීමෙහි ලා මූලික ඓතිහාසික සාධකය වූයේ වයඹදිග ඉන්දියාවේ සිට පැමිණි ආක්‍රමණිකයන්ගේ බෞද්ධ ආකල්පයන් ය. බෝධිසත්ත්ව සංකල්පය මහායානය ආරම්භයේ දී නොවුණ ද මෙම සංකල්පය ප්‍රභවය වූයේ භක්ති මාර්ගය හා විඥානවාදයේ මූලික ඉගැන්වීම් පදනම් කරගෙන ය.

ක්‍රි. පූ. තුන් වන සියවසේ සිදුවූ මහින්දාගමනයත් සමඟ මෙරට බුදු සමය ස්ථාපිත විය. ක්‍රි.පූ දෙ වන ශතවර්ෂයෙහි පමණ භාරතයේ ආරම්භ වූ සේ සැලකන බෝධිසත්ත්ව සංකල්පය ඊට ආසන්න කාලයේ ම ශ්‍රී ලංකාවට ලැබෙන්නට ඇතැයි සිතිය හැකි

බව සමහර වියතුන්ගේ මතය වේ.[9] මෙම සංකල්පයේ ආරම්භය හා විකාශනය පිළිබඳ ව විමසීමේ දී බෝධිසත්වයින් පිළිබඳ ව විමසා බැලීම ඉතා වැදගත් වේ. මෙයින් අනාවරණය වන්නේ බෝධිසත්වවරුන් වර්ග දෙකක් සිටින බවයි. පාලි බුදුසමයෙහි දැක්වෙන බෝධිසත්වවරුන්ට "මානුෂි බෝධිසත්වවරුන" ලෙස හඳුන්වයි. මහායානයේ ඉගැන්වෙන සම්භෝගකාය හා සම්බන්ධ බෝධිසත්වවරුන් "ධ්‍යානී බෝධිසත්වවරුන්" සේ හඳුනාගත හැකිය.[10] මහාචාර්ය කේ.එන්. ඕ. ධර්මදාසයන් විසින් දක්වන සඳහනට අනුව ථෙරවාදී මානුෂි බෝසත්වරුන් සහ මහායාන ධ්‍යානි බෝසත්වරුන් ලෙස කොටස් දෙකකට බෙදිය හැකිය. ලක්දිව බෝධිසත්ව සංකල්පය ආරම්භ වන්නේ මානුෂි බෝධිසත්වරුන්ගෙන් බව පෙනේ. විපස්සි, වෙස්සභූ, කකුසද, කෝණාගම, ගෞතම හා මතු බුදුවන මෛත්‍රී යන බෝසත්වරු මානුෂි බෝසත්වරුන් වශයෙන් වැදුම් පිදුම් ලබති. එම බෝසත්වරුන් අතරින් ද ලක්දිව වඩාත් ජනප්‍රිය වූයේ මෛත්‍රී බෝසත් සංකල්පය යි. බෞද්ධයන් මතු බුදුවන මෛත්‍රී බුදුන් දැක නිවන් දැකීමට කැමති වීම දැක්විය හැකිය. සම්බුදුවරුන්ගේ අභිනිෂ්ක්‍රමණය දැක්වෙන චිත්‍රයක් කුණ්ඩක ලෙනෙහි පැවති බව විසුද්ධිමග්ග අටුවාවේ දැක්වෙන බව මහාචාර්ය චන්ද්‍ර වික්‍රමගේ පවසයි.[11] මේ අනුව ලක්දිව බෝධිසත්ව සංකල්පයෙහි ආරම්භය ථෙරවාදය මූලිකව ක්‍රි. පූ. 2 වන සියවස හෝ ඊට ආසන්න කාලය ලෙස සැලකිය හැකිය.

ක්‍රි. පූ. දෙ වන සියවසේ ලක්දිව බෝධිසත්ව සංකල්පය පිළිබඳ අදහස් පැවති බවට සාධකයක් ලැබේ. දුටුගැමුණු රජු රුවන්වැලිසෑයේ ධාතු ගර්භයේ බෝධිසත්ව චිත්‍ර ඇඳි බවත්, මතු බුදුවන මෛත්‍රී බෝසතුන්ගේ දකුණු අගසව් වන බවට දුටුගැමුණු රජු පත්වන බවත්, සද්ධාතිස්ස දෙවන අගසව් වන බවත්, සාලිය රාජ කුමාරයා පුත්‍රයා වන බවත් කාවන්තිස්ස රජු සහ විහාර මහාදේවිය එම බෝසතුන්ගේ පියා හා මව වන බවත් මහාවංසයේ සඳහන පිළිබඳ ව මහාචාර්ය නන්දසේන මුදියන්සේ කරන අදහසින් ඉඟියක් ලැබේ.[12] එය නම් බොසත්

සංකල්පය එම වකවානුවේ සිට පවතින බවයි. දුටුගැමුණු රජ පවුල මෛත්‍රිය බෝසතුන් සමඟ සම්බන්ධ කිරීමට මහාවංස කතුවරයා උත්සාහ දරා ඇත.[13] ඒ බව සිංහල චූලවංශයේ ද සඳහන් වේ.[14] මෙම සාධක අනුව පැහැදිලි වන්නේ බුදුදහම ස්ථාපිත වී කෙටි කාලයක් තුළ බෝධිසත්ව සංකල්පය ලාංකික සමාජය තුළ ප්‍රචලිත වූ බවකි.

ශ්‍රී ලංකාවේ බෞද්ධ දේශපාලන අදහස්වලට ද මහායානික බලපෑම් ගැබ් වී තිබේ. සිව් වන මහින්ද යුගයට අයත් යැයි සැලකෙන අභයගිරි විහාර භූමියේ තිබී සොයාගන්නා ලද අභිලේඛනයකින් මීට පැහැදිලි සාක්ෂි ලැබේ. අවලෝකිතේශ්වර ආදී ප්‍රධාන බෝධිසත්වවරුන්ට අමතර ව ජනයාගේ ගෞරවාදරය ලබන රජවරුන් බෝසත්වරුන් සේ සැලකීම මෙම කාලයේ ඇති විය. ලක්දිව නොබෝසත්හු නොරජ් වන්නේයි,[15] යනුවෙන් සඳහන් වීමෙන් පාලකයා කවරෙකු විය යුතු ද යන්න මනාව සනාථ වේ. මේ අනුව පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ රජෙකු වීමට බෞද්ධයකු පමණක් නොව බෝධිසත්වයකු වීම ද අවශ්‍ය වූ බවයි. එම අභිලේඛනයෙහි උද්ගත වන අදහස නම් රජකමට පත්වන සියල්ලන් ම බෝධිසත්ත්වවරුන් විය යුතුයි යන්නයි.

බෝධිසත්ව සංකල්පයේ විකාශනය සමඟ අවලෝකිතේශ්වර හා මෛත්‍රී යන බෝධිසත්වවරුන් සිංහල බෞද්ධ, දේශපාලන හා සමාජ සංකල්පය තුළට අන්තර් ග්‍රහණය වීමක් 14 වන සිවයසේ සිට 17 සියවස දක්වා සිදු විය. මේ අනුව සත් වන සියවසේ සිට ලක්දිව බෞද්ධයා අතර ගෞරව බහුමානයට පත්වූ අවලෝකිතේශ්වර බෝසතුන් අවලෝකිතේශ්වර නාථ, ලෝකේශ්වර නාථ හෝ නාථ නමින් දේවත්වයට පත්වූ බව පෙනේ. මහනුවර රාජධානියෙහි නාථ දෙවියන් මෛත්‍රි බෝධිසත්වයන් හා බද්ධ ව එක දෙවි කෙනෙකු ලෙස පෙනී සිටි බව කිව හැකිය.

බෝධිසත්ව සංකල්පය හීනයාන මෙන්ම මහායාන බෞද්ධයන් අතර ද බෙහෙවින් ප්‍රචලිත වූවකි. ථෙරවාදී

බුදුදහමේ බෝධිසත්වයන් පිළිබඳ සඳහන් වන අදහස වඩාත් වර්ධනයට පත් කර ගත් මහායානිකයෝ එය බුද්ධත්වයටත් වඩා උසස් සේ සලකන්නට වූහ. බුදුබව ලැබීමෙන් නිවන් දැකීම මහායානිකයන්ගේ ප්‍රධාන සිද්ධාන්තයකි. මහායාන වාදයේ ආරම්භය නොතිබුණ බෝසත් සංකල්පය පසු කාලයේ දී ඇතිවීමට භක්ති මාර්ගය හා විඥානවාදය හේතුවන්නට ඇත.[16] බෞද්ධාගම ඥනමාර්ගයෙන් ආරම්භ වූ භක්ති මාර්ග යට යොමු විය. මහායානවාදය වෙනස් වන සමාජ ආකල්පයන් සමග ඉදිරියට පැමිණියේය. මහායානවාදය භක්ති මාර්ගයෙන්, හින්දු ආකල්පවලට නැඹුරු වීම නිසා තුමු බෝධිසත්වයෝය යන අදහස් ඔවුන් තුළ ඇති විය. ක්‍රි.පූ. දෙ වන සියවසයෙන් පසු ස්ථාවරත්වයට පත්වූ මහායාන බුදුදහමේ මූලික සංකල්පයකි බුද්ධ සංකල්ප ය. මෙකී බුද්ධ සංකල්පය නිසා බෝධිසත්ව සංකල්පය බිහි වී වර්ධනය වී බුදුරජාණන් වහන්සේටත් වඩා ඉහළින් වන්දනාමානයට බෝධිසත්වවරුන් පත්වූ බව මහායාන සංස්කෘතික සාහිත්‍යය විමර්ශනය කිරීමේ දී පැහැදිලි වේ.[17]

මහායාන බෝධිසත්වවරුන් ගේ සංඛ්‍යාව අප්‍රමාණ ය. සමහර සූත්‍රවල ලක්ෂ ගණන් බෝධිසත්වරයෝ වෙති. අවලෝකිතේශ්වර යනු මහායානයෙහි උගන්වන පංචධ්‍යානි බුදුවරයන් අතරින් ප්‍රධානත්වයෙහි ලා සැලකෙන අමිතාභ නොහොත් අමිතායුෂ්[18] බුදුවරයා වෙනුවෙන් මේ ලෝකයෙහි පෙනී සිටින, සියලු සතුන්ගේ දුකට පිහිට වන බෝසත්වරයා ය.[19] මහායානය තුළ ධ්‍යානි බෝධිසත්ව, මහා ස්ථාන, ප්‍රාජති ත්‍රෛලොක්‍යවිජයි යනුවෙන් හඳුන්වන බෝධිසත්වයන් අට දෙනෙකු ඇත. එනම් අවලෝකිතේශ්වර, ආකාශගර්භී, වජ්‍රගර්භී, ක්ෂිති ගර්භී, සර්වානිවාරණ විෂ්කම්භි, මෛත්‍රිය, සමන්ත භද්‍ර සහ මංජු ශ්‍රී ලෙස දැක්විය හැකිය. සියලු බෝධිසත්වවරයන්ගෙන් ප්‍රධාන වන්නේ අවලෝකිතේශ්වර සහ මංජු ශ්‍රී බවත් මොරටුවේ ශාසන රතන හිමි ගෙන හැර දක්වයි. [20]

මහායාන බුදු සමයෙහි ප්‍රධාන තැනක් ගන්නා බෝධිසත්ව සංකල්පය යටතේ වඩාත් ජනප්‍රියත්වයට පත් වූයේ අවලෝකිතේශ්වර ය.[21] මෙලෙස දෙවියන් ලෙසින් බෝධිසත්ව වරයෙකු හැඳින්වීමට හේතු වූයේ බෝධිසත්වවරුන් ද දෙවිවරුන් මෙන් මහායානිකයන් විසින් ඇදහීම යැයි ගෙන හැර දැක්විය හැකිය.[22] මෙම මහායාන බෝධිසත්ව සංකල්පයෙහි ජනප්‍රිය වූ අවලෝකිතේශ්වර ඇදහිල්ල ආසියාතික රාජ්‍යයන් රාශියකට වර්ධනය වෙමින් ව්‍යාප්ත විය.[23] මෙම වන්දනය ලංකාව, නේපාලය, තායිලන්තය, බුරුමය, ඉන්දුනීසියාව, චීනය, ජපානය, කොරියාව සහ මොංගෝලියාව ආදී රටවල පැතිර ඇති බව පෙනේ.

අවලෝකිතේශ්වර නැමැති සංගෘහිත වාදය අවලෝකිත, ඊශ්වර යන වචන දෙකින් යුක්ත බව බැලූ බැල්මට පෙනේ. අවලෝකිත - ඊශ්වර යන සංස්කෘත පද දෙක සන්ධි වීමෙන් අවලෝකිතේශ්වර යන්න සෑදී ඇති බවට බොහෝ උගතුන් විසින් විවරණ සපයා ඇතත්, චීන බෞද්ධ ග්‍රන්ථවල එය අවලෝකිත - ස්වර යන වචන දෙකේ එකතුවක් ලෙස සලකා ඇති බව පෙනේ.[24] අවලෝකිතස්වර, අවලෝකිතේශ්වර නාථ, ලෝකේශ්වර, ආරෝග්‍ය ශාලා නාථ, භෛසජ්ජගුරු යන නම් කිහිපයකින් ම මේ බෝධිසත්වයන් හැඳින්වේ. මෙම සංයුක්ත නාමයේ අර්ථය විවිධ පඬිවරුන් විසින් විවිධාකාරයෙන් නිර්වචනය කරනු ලැබේ. අප දන්නා දැයෙහි අධිපති, පාදුර්භූත හෝ හැම තැනම දක්නට ඇති අධිපති, ඉහළින් දක්නා ලබන අධිපති, බාලාවදාරණ අධිපති, කාරුණික බැලුම් හෙළන අධිපති, දකින උතුමා, පෙනෙනන්ට තිබෙන දැයෙහි අධිපති, දෘශ්‍යමාන හෙවත් වෘත්තියක් ව සිටින උතුමා, කාරුණික බැලුම් හෙළන උතුමා, සමස්ත විශ්වය ම බලන ප්‍රධානියා එකී නිර්වචනවලින් සමහරකි.[25] ඉන්දු, චීනය, සියම, කාම්බෝජය, සහ ජාවා යනාදී රටවල ඔහු ලෝකේශ්වර නමින් හැඳින්වේ.[26] අවලෝකිතේශ්වර චීන බසින් නම් කොට ඇත්තේ (Guan - shi - yin) (හුවාන්

ෂින් යින්) යනුවෙන් ද (Kwan Non) ජපානයේ ( kwan Non) (ක්වාන් නෝන්) යනුවෙන් ද හැඳින්වේ.[27] මහායානිකයන්ගේ විවිධ බොහෝ බෝධිසත්වයෝ අතර අවලෝකිතේශ්වර භෞතික නිර්මාණයකි.[28] අමිතාභ ධ්‍යානි බුදුරදුන්ගේ ප්‍රතිබිම්භය සේ පහළ වූ බෝධිසත්වයකු ලෙස ද මෙතුමා හඳුන්වයි. විශ්වයේ නිර්මාපකයා මෙන් ද, බෞද්ධයන්ගේ හා බුද්ධ ධර්මයේ ආරක්ෂකයා මෙන් ද මෙතුමා පෙනී සිටියි.

අවලෝකිතේශ්වර වන්දනාවේ විකාශය පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී මහායාන ධර්මයේ වර්ධනයත් සමඟ අවලෝකිතේශ්වර චරිතය වර්ධනය වූ බවට පැහැදිලි සාක්ෂි හමුවේ. මුල් ම මහායානික ග්‍රන්ථවල මෙම නාමය පවා සඳහන් නොවේ. එහෙත් පසුකාලීන ව බිහිවූ කෘතිවල මොහු පිළිබඳ ව විස්තර අඩංගු වේ.[29] සුඛාවතී ව්‍යුහ සූත්‍රය මෙතුමා හඳුන්වන්නේ (Son of the Buddha ) බුදුන්ගේ පුත්‍රයකු ලෙසයි.[30] මහායාන ධර්ම සංවර්ධනයේ දී අවලෝකිතේශ්වර චරිතයේ වර්ධන අවස්ථා පැහැදිලි ව හඳුනාගැනීමට ලැබේ.

අවලෝකිතේශ්වර බෝධිසත්වයන් ඉන්දියාව තුළ ආරම්භ වී ප්‍රචලිත වීමට ඉවහල් වූ කරුණු සොයා බැලිය යුතුය. ගෞතම බුදුරජාණන් වහන්සේගේ මානුෂීය ගුණාංග යටතේ අතිමානුෂීය ගුණාංග වර්ධනය වන්නට සැලැස්වූයේ උන්වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු භාරතයේ ඇති වූ බ්‍රාහ්මණ, දේවවාදී ආගමික ඉගැන්වීම්වලට ශක්තිමත්ව මුහුණ දීමේ අවශ්‍යතාව ඇති වූ නිසාය. එහි දී අපේක්ෂිත තත්ත්වයට වඩා හාත්පසින් වෙනස් වූ තත්ත්වයකට බුද්ධ සංකල්පය පිළිබඳ අදහස් ක්‍රමයෙන් යොමු වී වර්ධනය වීමත් ඒ ආශ්‍රය කරගෙන බෝධිසත්ව සංකල්පය ද වර්ධනය විය. කාලීන අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් තරම් ශක්තිමත් වූ බෝධිසත්වවරයෙකු සිටීමේ වැදගත්කම අවබෝධ කරගත් බෞද්ධයෝ ඒ සඳහා අවලෝකිතේශ්වර චරිතය වර්ධනය කර ගැනීමට තැත් කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස අවලෝකිතේශ්වරගේ චරිතයෙහි බ්‍රාහ්මණ දේව ගුණ හා

බුදුරජාණන් වහන්සේගේ ගුණ විශේෂයෙන් දක්නට ලැබුණි. මේ නිසා බ්‍රාහ්මණ ආගමික ඉගැන්වීම් හා ඉතිහාස කතාවන්හි සඳහන් වන විවිධ අංගෝපාංග හා චරිත ද බුදුරජාණන් වහන්සේගේ මානුෂික ගුණ විශේෂයන් හා එතුමාගේ චරිතය හා සම්බන්ධ විවිධ සිදුවීම් ද සංකලනය වීමෙන් අවලෝකිතේශ්වර සංකල්පය ප්‍රමුඛ බවට පත්විය.[31]

භාරතයේ මෙතුමා අදහන්නට පටන් ගත් කාලය නියත වශයෙන් කිව නොහැකිය. එහෙත් ක්‍රි. ව. 3 වන ශතවර්ෂය වන විට මෙතුමා ඇදහීම භාරතයේ සමාන්‍ය සිද්ධියකි.[32] හත් වන ශතවර්ෂය වන විට බොහෝ බෞද්ධ රටවල අවලෝකිතේශ්වර අදහන ලද බැව් පාහියන්ගේ වාර්තාවෙන් පැහැදිලි වේ.[33] මහායාන බුදු සමයෙහි ප්‍රධාන තැනක් ගන්නා බෝධිසත්ව සංකල්පය යටතේ වඩාත් ජනප්‍රියත්වයට පත් වූයේ අවලෝකිතේශ්වර නාථ දෙවියන් ය.[34] මෙලෙස දෙවියන් ලෙසින් බෝධිසත්වවරයෙකු හැඳින්වීමට හේතු වූයේ බෝධිසත්වවරුන් දෙවිවරුන් මෙන් මහායානිකයන් විසින් ඇදහීම යැයි ගෙනහැර දැක්විය හැකිය.[35] මෙම මහායාන බෝධිසත්ව සංකල්පයෙහි ජනප්‍රිය වූ අවලෝකිතේශ්වර නාථ දේව ඇදහිල්ල ආසියාතික රාජ්‍යයන් රාශියක ජනප්‍රියත්වයට පත්වූ බවට සාධක ඇත. ථෙරවාද වේවා මහායාන වේවා බුදුදහමේ ව්‍යාප්තියත් සමඟ අවලෝකිතේශ්වර බෝධිසත්ව වන්දනාව ආරම්භ වී ව්‍යාප්ත වීමේ දී දක්නට ලැබුණු ලක්ෂණ කිහිපයකි. එනම්,

1. ලෞකික ලෝකෝත්තර දෙඅංශයෙහි ම ගැලවුම්කරුවකු ලෙස පෙනී සිටීම.
2. ඒ ඒ අවස්ථානුකූල ව විවිධ ස්වරූප ගැනීමේ හැකියාව.
3. ඉතා සරල ආමන්ත්‍රණයකින් වුවද පිහිට ලබා ගැනීමේ හැකියාව.
4. එදිනෙදා පොදු හෝ පෞද්ගලික ප්‍රශ්නවල දී මානසික සුවයක් ලබා ගැනීමට හැකි වීම.

5. ඒ ඒ දේශයට ගැලපෙන අයුරින් වන්දනය කිරීමේ හැකියාව.[36]

මෙම ලක්ෂණ නිසා ජනතාව අතර ඉතා ජනප්‍රියත්වයට අවලෝකිතේශ්වර පත් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස මෙම බෝධිසත්වයන්ගේ චිත්‍ර, ප්‍රතිමා නිර්මාණ කිරීමට ද කලාකරුවෝ උත්සාහ දැරූහ. එහි දී මහායානිකයෝ අවලෝකිතේශ්වර බෝසතුන්ගේ රූප ස්වභාවය මගින් මහායානික අදහස් ක්‍රියාවට නැංවීමට උත්සාහ දැරූහ.

මේ අයුරින් ආරම්භ වූ මෙම බෝධිසත්ව සංකල්පය ලාංකීය හර පද්ධතිය තුළට ප්‍රවිෂ්ට වූයේ කෙසේ ද යන්න අවබෝධකර ගත යුතුය. ලක්දිව මහායාන අදහස් බලපාන්නට වූ විට අවලෝකිතේශ්වර ඇදහිල්ල ද පැතිර ගියේ ය.[37] ක්‍රි. ව. හත් වන ශතවර්ෂය වන විට බොහෝ බෞද්ධ රටවල් අවලෝකිතේශ්වර අදහස ලද බැව් ෆාහියන්[38] හා හියුංසියෑන්ගේ වාර්තාවලින් පෙනේ. මෙරට අවලෝකිතේශ්වර ඇදහිල්ල පිළිබඳ ව අධ්‍යයනය කළ ආචාර්ය ජේ. සී. හෝල්ට් දක්වන්නේ යටත් පිරිසෙයින් ක්‍රි.ව. 7 - 8 වැනි ශතවර්ෂවලට අයත් යැයි සැලකෙන තිරියාය අවලෝකිතේශ්වර ප්‍රතිමාවේ පටන් ඉදිරියට මෙම ඇදහිල්ල විකාශය වී ඇති අන්දමයි.[39]

වර්තමාන ලාංකීය ආගමික සංස්කෘතිය දෙස විමසිලිමත් වීමේ දී එය ලෝකයේ ඕනෑම සංස්කෘතියක් මෙන් බහුරූපී වේ. ලංකා සමාජය බහුරූපී වීම සඳහා ඉවහල් වූ හේතු අතර ප්‍රධාන වන්නේ ස්වාභාවික පිහිටීමයි. දකුණු ඉන්දියාවට ආසන්න ව පිහිටා ඇති දිවයින දූරාතීතයේ සිට ම සමුද්‍රාසන්න වෙළෙඳ යුද්ධෝපාය මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වී ඇත. මෙ නිසා ලංකාව අන්තර් සංස්කෘතික ස්පර්ශයට සහ සංස්කෘතික අනුකලනයට තෝතැන්නක් ව පැවත ඇත.

ශ්‍රී ලංකාවේ ස්වාභාවික පිහිටීම හේතුවෙන් පුරාතන, මධ්‍යකාලීන හා නූතන යන සෑම යුගයක ම විදේශීය ජාතීන්ගේ

අවධානය යොමුව තිබේ. මෙරටට පැමිණි විවිධ ජාතීන් අතරින් ලාංකීය සංස්කෘතියට වැඩි බලපෑමක් කර ඇත්තේ ක්‍රි.පූ. 4 - 5 සියවස්වල ලංකාවට පැමිණි කණ්ඩායම් මගිනි.[40] එමෙන්ම 1796 බ්‍රිතාන්‍යයන් මෙරටට පැමිණ වතුවගාව ආරම්භ කර එහි සේවයට විශාල වශයෙන් දකුණු ඉන්දියානු වතු කම්කරුවන් ඇතුළු භාරතීය ජන සංක්‍රමණ, ශ්‍රී ලාංකීය සංස්කෘතිය ප්‍රබල වෙනසකට බඳුන් වීමට හේතු විය. මෙලෙස පැමිණි භාරතීය සංක්‍රමණිකයන් අතර පැවති සංකේත, විශ්වාස හා ආගමික විශ්වාස ද මෙරට සංස්කෘතියට සම්මිශ්‍ර වූ බව පෙනේ.

එකී සංක්‍රමණ තුළින් භාරතයේ පැවති දේශපාලන ආර්ථික හා සංස්කෘතික මතවාද ද පැමිණි බව කිව හැකිය. දක්ෂිණ භාරතීය සම්භාව්‍ය සංස්කෘතිය හා බැඳුණු ප්‍රධාන ආයතන සමඟ මෙන් ම භාරතයේ හා අග්නිදිග ආසියාතික රටවල විවිධ ආගමික හා දේශාටන මධ්‍යස්ථාන සමඟ පැවති සබඳතා, ඒ කාලයේ ලාංකීය ආගමික පරිසරය තුළ පැවති නම්‍යශීලි භාවය ආදි හේතු නිසා ද මෙසේ විවිධ ආගමික සංකල්ප මෙම සංස්කෘතියට සංකලනය වන්නට ඇත. එලෙස සිදු වූ ආගමික සංකලනයේ ප්‍රතිඵලයක් ලෙස වර්තමානය දක්වා බෞද්ධ සම්ප්‍රදායේ පවතින හින්දු ආගමික සංකල්ප ජන සමාජයට කාවැදී සමාජගත විය. විවිධ හේතු සාධක රැසක් මත මහායාන බෞද්ධ සම්ප්‍රදායේ සුවිශේෂි ඇදහීම් ක්‍රමයක් වූ අවලෝකිතේශ්වර බෝධිසත්ව වන්දනයට ප්‍රවේශ වූ ආකාරයක් දක්නට ලැබේ.

බෝධිසත්ව වන්දනයට ප්‍රධාන තැනක් ලබාදීම මහායානයේ මෙන්ම හීනයානයේ ද දක්නට ලැබෙන ලක්ෂණයකි.[41] භාරතීය සංක්‍රමණ ඇසුරෙන් ලංකාවට ලැබූ බෝධිසත්ව වන්දනය ලක්දිව අනුරාධපුර යුගයේ සිට ම ප්‍රචලිත ව පැවති බව පෙනේ.[42] මහායාන මූර්ති ශිල්පයේ බලපෑම ලක්දිවට පැමිණියේ දැයි ස්ථිර ව හඳුනාගැනිමට අපහසු වුව ද අනුරාධපුර මුල් අවධියේ සිට ම මහායාන මූර්ති පවතින්නට ඇති බව මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ අදහස්

වේ. මේ ඇසුරෙන් ලක්දිව අනුරපුර යුගයේ අවසාන භාගය වන විට අවලෝකිතේශ්වර බෝධිසත්ව වන්දනය මෙරට ආරක්ෂිත ව පැවති බව iv වන මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපියේ සඳහන් "ලක්දිව නොබෝසත්හු රජ නොවෙම්යැයි"[43] යන පාඨයෙන් සනාථ වේ. භාරතීය සංස්කෘතික දායාදයක් ලෙස බෝධිසත්ව වන්දනය අපට ලැබුණේ යැයි විශ්වාස කළ ද බෞද්ධ බෝධිසත්ව වන්දනය ලෝකයට හඳුන්වාදෙන ලද්දේ මධ්‍ය ආසියානු බුදුදහම විසින් යැයි පිළිගැනීමක් ද වේ.[44] නමුත් දැනට පිළිගත් මතය වී ඇත්තේ භාරතීය සංස්කෘතික අභාසයක් ලෙස මෙරටට ලැබෙන බෝධිසත්ව වන්දනය පසුව ලාංකික සමාජය තුළ ස්ථාපිත වූ බවයි.

මේ අයුරින් මහායාන බුදුසමයත් සමඟ ලංකාවට පැමිණි බෝධිසත්වවරුන් අතර අවලෝකිතේශ්වර හා මංජු ශ්‍රී ප්‍රධාන තැනක් ගනිති. අවලෝකිතේශ්වර ඒ නමින් ප්‍රකට වූ නමුත් පසුකලක දී නාථ දෙවියන් වශයෙන් ද සමන්ත භද්‍ර දෙවියන් ලෙස ද ප්‍රකට විය.[45] මෙරට සංස්කෘතියට අලුතින් අන්තර්ගත වූ සංකල්පයක් වුවද එමගින් බෞද්ධ ධර්ම විභාගයට අභියෝගයක් එල්ල වූ බවක් නොපෙනේ. අවලොකිතේශ්වර සංකල්පය භාරතීය ආභාසයක් ලෙස මෙරටට ලැබුණ ද එය ථෙරවාදයේ ඉගැන්වීම් තුළ එහි ප්‍රායෝගික බව වඩාත් පුළුල් විය. තවද මෙම සංකල්පය ශ්‍රී ලාංකික සංස්කෘතියෙන් පරිබාහිර ව උපත ලබා කාලයත් සමඟ ලාංකීය සංස්කෘතියට උකහාගෙන ඇත. ඉන් සනාථ වන්නේ ශ්‍රී ලාංකික සංස්කෘතියේ පවත්නා විවිධ ලක්ෂණ වැළඳ ගැනීමේ නැඹුරුව ය.[46]

පරිබාහිර සංස්කෘතියකින් උකහා ගන්නා සංස්කෘතිකාංග තම අනන්‍යතාවට අනුකූලවන පරිදි සකස් කර ගැනීමට ශ්‍රී ලාංකිකයන්ට පවත්නා සහජ දක්ෂතාව නිසා ම මෙම බෝධිසත්ව සංකල්පය ද ථෙරවාදී දහම තුළට උකහා ගනිමින් ශ්‍රී ලාංකීය සංස්කෘතිය තුළ එහි පැවැත්ම ස්ථිර කරගත් බව පෙනේ. අවලෝකිතේශ්වර සංකල්පය සිංහල බෞද්ධ සමාජයට

හා දේශපාලන සංකල්ප පද්ධතිය තුළට අන්තර්ග්‍රහණය වීම සිදු වූයේ 13 වන හෝ 14 වන සියවසේ දී බව සනාථ වේ.[47] එනමුත් ඊට පෙර සිට ම අවලෝකිතේශ්වර වන්දනය මෙරට පැවති බවට සාධක හමුවේ. තිරියායේ සඳහන් ගුරුවලෝකිතේශ්වර ඉති දූෂිතො බලවා, යන පාඨය [48] තුළින් ගම්‍ය වන්නේ යටත් පිරිසෙහි ක්‍රි.ව 7 වන ශතවර්ෂයේ දී වත් අවලෝකිතේශ්වර වන්දනය මෙරට ප්‍රචලිත ව පවතින්නට ඇති බවයි.[49]

ආගමික සංකල්පයක් ලෙස ආරම්භ වූ අවලෝකිතේශ්වර ඇදහිල්ල ජන සමාජය තුළ ස්ථාපිත වීමට දේශපාලන සහයෝගය ද හේතු විය. බෝධිසත්ව සංකල්පය හා මෙරට දේශාපාලන සංස්කෘතිය සියුම් විග්‍රහයකට භාජනය කිරීමේ දී පැහැදිලි වන අදහසක් වන්නේ මහායාන බෝධිසත්වයකු හා තන්ත්‍රයානීය දෙව්වරයකු ලෙස අවලෝකිතේශ්වර සංකල්පය වර්ධනය වීමට පෙර ථෙරවාදය තුළ බෝධිසත්ව සංකල්පය දියුණු වෙමින් පැවති බවයි. සිංහල බෞද්ධ සමාජය තුළ බෝධිසත්ව සංකල්පය ව්‍යාප්ත වීමට බලපෑ කරුණු තුනක් ඇත.

1. බුදුවීමට පෙර සිදුහත් චරිතය ජාතක කථාවල දැක්වෙන ගෞතම බුදුන් වහන්සේ සම්බන්ධ බෝධිසත්ව කථා.

2. අනාගතයේ බුදුවන මෛත්‍රී බුදුන් හා සම්බන්ධ බෝධිසත්ව චරිතය.

3. ධාර්මික රජෙකු නිවන් මඟට පිළිපන් බෝධිසත්වයකු වෙතැයි යන සිංහල බෞද්ධ සංකල්පය යනාදී වශයෙනි.[50]

ඉහත කරුණු දෙස අවධානය යොමු කිරීමේ දී අවබෝධ වන්නේ පූර්ව මධ්‍යකාලීන අවධියේ සිට ලාංකීය චින්තනය තුළ අවලෝකිතේශ්වර වන්දනය වර්ධනය වෙමින් පැවති බවයි. තවද මෙම ඇදහීම පැවිදි සමාජය පමණක් නොව ගිහි සමාජය තුළ ද ප්‍රචලිත වීම කැපී පෙනේ. එලෙස වර්ධනය වූ

බෝධිසත්ව සංකල්පය පූර්ව මධ්‍යකාලීන ශ්‍රී ලාංකික බැතිමතුන් ආගම කෙරෙහි පොළඹවන මානසික බලපෑමක් කරන්නට ඇති බවට අනුමාන කළ හැකිය. මෙම හේතු නිසා අවලෝකිතේශ්වර ඇදහීම මගින් බුද්ධත්වය හා සැදැහැවත් පිරිස් පිළිබඳ ජනප්‍රිය සංකල්පය ඇති වී ප්‍රජා බලය හා ආධ්‍යාත්මික බලය කෙරෙහි පැවති ඉඩකඩ පුළුල් විය. තවද ශ්‍රී ලාංකිකයන් අවලෝකිතේශ්වර වන්දනය ප්‍රධාන අරමුණු දෙකක් පෙරදැරිව සිදු කර ඇත. එනම් ලෝකෝත්තර සුවය හා ලෞකික අවශ්‍යතා ඉටුකර ගැනීමයි.

නූතන සංකීර්ණ සමාජයේ ජීවත් වන අපට මුහුණ දීමට සිදුවී තිබෙන ගැටලුවලට හා අවශ්‍යතාවන්ට අදාළ පිළිතුරු සෑම විට ම ධර්මානුකූල ඒවා නොවීමට ඉඩ ඇත.[51] මේ නිසා ප්‍රායෝගික වශයෙන් ධර්මිෂ්ඨ නොවන්නා වූ ඇතැම් කාර්ය සාධනයට බෝධිසත්ව ගුණෝපේත බෝසත් දෙවිවරුන්ගේ සහය නොපතා, ලෞකික නැඹුරුවක් ඇති සැඩ පරුෂ දෙවි දේවතාවුන්ගේ සහය පැතීමක් දක්නට ලැබේ. ඒ අනුව එයට කෘතගුණ දැක්වීම උදෙසා ද අවලෝකිතේශ්වර වන්දනයට මොවුන් යෙද වූ බෝසත් දෙවිවරුන්ගේ සහාය නොපතා ලෞකික නැඹුරුවක් ඇති දෙවි දේවතාවුන්ගේ සහාය පැතීමක් දක්නට ලැබේ. මේ අනුව ලාංකීය අවලෝකිතේශ්වර බැතිමතුන් එම බෝධිසත්වයන්ට වන්දනා කිරීම තුළින් දුක් නිවා ලෝකයේ ධර්මය ස්ථාපිත කිරීමත්, බුද්ධ ධර්මය යන දෙක මෙලොව තහවුරු කිරීමත් ප්‍රාර්ථනා කළ බව දක්නට ලැබේ.[52] එසේ තවත් විශ්වාසයක් වූයේ ධර්මය දුර්වල ව පැවති සිංහල රාජධානියේ සෑම ප්‍රදේශයක ම ත්‍රිවිධ රත්නය ස්ථාපිත කිරීමට හැකි වූයේ අවලෝකිතේශ්වර මැදිහත් වීමෙන් ඒ බව පෙනේ. තවද මහායානයට අනුව අවලෝකිතේශ්වර සම්භෝග කාය වශයෙන් ලොව අවලෝකනය කර සසරින් මිදීමට අපේක්ෂා කරන අයට පිහිට වේ. එබැවින් සිංහලයන් අවලෝකිතේශ්වර වන්දනාමාන කිරීම තුළින් සසරින් මිදීමට ඔහුගේ උපකාරය අපේක්ෂා කර ඇත. මේ හේතු නිසා ම ක්‍රි.ව 8 - 10 වැනි සියවස් කාලයේ දී

අනුරාධපුර අගනුවර සමහර විහාරස්ථානවල අවලෝකිතේශ්වර පුද පූජා කරනු ලැබූ අතර ඔහු හා සම්බන්ධ මහායාන විශ්වාසය සේ ම විමුක්ති මාර්ගය ද ප්‍රචලිත ව පැවති බව පෙනේ.

කෙසේ නමුදු ඉහත සමස්තය ගෙන බලන විට අවලෝකිතේශ්වර බෝධිසත්වයන් සුවිශේෂී වනුයේ උන්වහන්සේ මහායානයේ එන ලෞකික, ලෝකෝත්තර යන අංශ දෙකට ම පවතින සම්බන්ධතාව නිසාය. එසේ ම උන්වහන්සේ සිංහල සංස්කෘතියට ඇතුළත් වන්නේ ද මෙම ඓතිහාසික වැදගත්කම නිසාය. ඔහු සතුව පැවති ලෞකික බලය නිසා ම අවලෝකිතේශ්වර නාථ දෙවි ලෙස සලකා උඩරට ජනතාව විසින් පුද සත්කාර කළ බව කිව හැකිය.

ලක්දිව පැවති අවලෝකිතේශ්වර වන්දනය සමඟ තාරා දෙවඟන ඇදහීම ද ප්‍රචලිත විය. මෙරට බෝධිසත්ව ප්‍රතිමා සමඟ එම වන්දනාවට සම්බන්ධ බෝධිසත්ව ශක්ති වන්දනාව ද අනුරාධපුර යුගයේ අවසාන භාගයේ දී ප්‍රචලිත වන්නට ඇතැයි නිගමනය කළ හැකිය. මහායාන ග්‍රන්ථවලට අනුව තාරා යනු අවලෝකිතේශ්වර බෝසතුන්ගේ භාර්යාවයි.[53] වජ්‍රයානය ක්‍රි. ව. 9 වැනි සියවසේ දී පමණ මේ දිවයිනට පැමිණීමෙන් අනතුරුව අවලෝකිතේශ්වර බෝධිසත්වයාගේ බිරිඳ වූ තාරා වන්දනය ද ස්ථාපිත වන්නට ඇත. මෙම ආගමික සංකල්ප ව්‍යාප්තවීම සඳහා රාජානුග්‍රහය ද ලැබුණු බව පෙනේ. විශේෂයෙන් ම පළමුවන සේන රජු ( ක්‍රි. ව. 833 - 853 ) වජ්‍රායානය වැළඳගැනීම ඊට කදිම නිදසුනකි.[54] මෙම අවධියේ වජ්‍රපර්වත නිකායවාසී භික්ෂුවක් ලක්දිවට වාජිරීය වාදය ගෙන ආයේ ය. රජතුමා එය පිළිගත් හෙයින් ඊට අනුබල ද ලැබුණි. වාජිරීය වාදය නැගෙනහිර භාරතයේ ප්‍රචලිත ව පැවති වජ්‍රයානය විය හැකිය. හතරවන මිහිඳු රජු ( ක්‍රි. ව. 956 - 972 ) මහින්තලේ පිහිටුවන ලද ලිපියක, මිණිනාල්, වශයෙන් තාරා බිසව හඳුන්වා තිබෙන බව පරණවිතාන මහතා පවසයි.[55] එසේ ම හත් වන සියවසට අයත් තිරියාය සෙල් ලිපියේ තාරා බිසව, මිණිනාල් යනුවෙන්

හඳුන්වා ඇති බව පෙනේ. සිංහල බුද්ධාගමේ, බිසෝ බණ්ඩාර, නමින් ඇය හැඳින්වේ.[56] තිසර සංදේශයෙහි[57] තාරා බිසෝ ලෙස ද වෙගිරිය දේවාලයේ [58] තාරා බිසෝ බණ්ඩාර ලෙස ද ඇය සමාන්‍යයෙන් හැඳින්වේ.

තාරා බෝසත් ගණයට අයත් දේවතාවියකි.[59] තාරා යන්නෙහි අර්ථය ගැලවුම්කාරිය නොහොත් සංසාරයෙන් මුදා ගන්නා තැනැත්ති යන්නයි. ඇගේ ප්‍රභවය පිළිබඳ අත්භූත කථා රැසක් ඇති අතර අමිතාභ බුදුන්ගේ ඇසින් නිකුත් වූ නීලවර්ණ රශ්මියකින් තාරා උපන් බව සඳහන් වේ.[60] අවලෝකිතේශ්වර බෝධිසත්වයන්ගේ ඇසින් වැටුණු කඳුළු බිඳුවකින් පොකුණක් මැවුණු බැව් ද, එහි හටගත් පද්මයකින් තාරා උපන් බව ද සමහර තැනක සඳහන් වේ. ආරම්භයේ දී එකම තාරා බිසව පසු කාලයේ තාන්ත්‍රික ධර්මයේ බලපෑම නිසා ගණනින් වැඩි වූවාය. එබැවින් තාන්ත්‍රික ධර්මය අනුව තාරා බිසෝවරු ගණනාවකි. එනම්, සිතතාරා, හරිතතාරා, රක්තතාරා, නීලතාරා, ශ්වෙත තාරා යනුවෙනි. ශ්වේතතාරා දේවිය සර්ව සම්පූර්ණ පිරිසිඳු භාවය හඟවන්නියකි. මැය අවලෝකිතේශ්වර ගේ ප්‍රියා වශයෙන් ද සලකනු ලැබේ. ඒ නිසා ඇය නිරන්තරයෙන් ඔහුගේ දකුණු පසින් සිටිනු පෙනේ. මේ සඳහා හොඳ ම නිදසුන වන්නේ බුදුරුවගල නිර්මිත තාරා ප්‍රතිමාවයි. තාරා දේවියගේ ප්‍රතිමාව ද යෝගි සහ රාජකුමාරි තරා ලෙස වර්ග දෙකකින් සමන්විත ය. මෙම ප්‍රතිමා නියෝජනය කරනු ලබන අනුවර්ගවලට අයත් ප්‍රතිමා රැසකි. නමුත ශ්‍රී ලංකාවේ බහුල වශයෙන් පුදනු ලබන්නේ යෝගි වර්ගයට අයත් තාරා පිළිමය. අනුරාධපුර, පොළොන්නරු යුගවලින් පසු නැවත තාරා ඇදහීම ලක්දිව ජනප්‍රිය වූයේ 14 සියවසින් පසුවය.